# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2024.01.09

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ මෙනවිය (ප්‍රධාන ලේකම්)**

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශ (බ.ප) |
| 05) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශ (බ.ප) |
| 06) | ඩී.පී.වික්‍රමසිංහ මයා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශ (බ.ප) |
| 07) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශ (බ.ප) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( වැ.බ) (පාලන) |
| 08) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 11) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 12) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 13) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 14) | ආර්.එම්.ඩී.කුමාරි රාජපක්ෂ මිය | - | සහකාර ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය (බ.ප) |
| 15) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | නදීෂා ඩී. සපරමාදු මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2024.01.09 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී එළඹි තීරණ පහත පරිදි වේ.

<table>
<tr><th>අනු අංක ය</th><th>කාරණය</th><th>තීරණය</th><th>ක්‍රියාත්මක කිරීමේ බලධාරියා</th></tr>
<tr><td>01</td><td>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව</td><td>
2023 වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් ප්‍රතිපාදන වැය කිරීමේ ප්‍රගතිය දැනට වාර්ෂිකව ඇති ආකාරය පහත සඳහන් පරිදි වන බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>
<table>
<tr><th>අමාත්‍යාංශය</th><th>මූල්‍ය ප්‍රගතිය</th><th>භෞතික ප්‍රගතිය</th></tr>
<tr><td>පළාත් පාලන අමාත්‍යාංශ ය</td><td>93.87</td><td>97.48</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශ ය</td><td>98.08</td><td>99.04</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශ ය</td><td>96.58</td><td>99.25</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශ ය</td><td>96.59</td><td>99.59</td></tr>
<tr><td>ප්‍රවාහන අමාත්‍යාංශ ය</td><td>96.88</td><td>96.66</td></tr>
<tr><td>ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති</td><td>96.85</td><td>98.67</td></tr>
</table><br>
මෙම ප්‍රගතිය තව දුරටත් වැඩි වීමේ ප්‍රවනතාවක් දක්නට ලැබෙන බවද වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br><br>
මාස 6ක් පමණ කාලයක් පැවති පැවති වර්ෂා සහිත කාලගුණ තත්ත්වය මත 95% ක ප්‍රගතියකට හෝ ළඟා වීමට බොහෝ අසීරු වූවත් හිටපු ප්‍රධාන ලේකම් ප්‍රමුඛ සියලුම ලේකම්වරුන් ඇතුළු නිලධාරීන්ගේ උත්සාහය මත මෙවැනි ප්‍රගතියක් කරා ළඟා වීමට හැකියාව ලැබුණු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් සඳහන් කරන ලදී.එමෙන්ම පැවති වර්ෂා තත්ත්වය මත කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාරි මාර්ග සම්බන්ධ ව්‍යාපෘතීන් දුෂ්කරතා මධ්‍යයේ වුවද සාර්ථක ලෙස සිදු කිරීමට හැකි වූ බවත් සෞඛ්‍ය අංශ සංවර්ධන වැය මඟින් සිදු කරන ව්‍යාපෘති ඉතා සාර්ථක ලෙස නිමකර වීමට සිදුවූ බවත්, අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති යටතේ බලාපොරොත්තු වූ ප්‍රමාණයට ප්‍රතිපාදන නොලැබුණු නමුත් අනිකුත් ප්‍රතිපාදන යොදවා එම ව්‍යාපෘතීන්ද සාර්ථක ලෙස සිදු කිරීමට හැකි වූ බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br><br>
මෙවැනි සාර්ථක ප්‍රගතියක් කරා ළඟාවීම කෙරෙහි සියලුම ලේකම්වරුන් වෙත සිය ස්තූතිය පලකරමින් 2024 වර්ෂයේදීද මෙවැනි ප්‍රගතියක් කරා ළඟා වීමට හැකිවන පරිදි කටයුතු කිරීම වැදගත් බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.
</td><td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ ඉංජිනේරු / මූල්‍ය)</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| 02. | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සම්බන්ධව | පළාත් සභා ඇමතිවරුන්ගේ භාවිතය සඳහා ලබා දුන් නවීන වාහන නැවත වරක් පළාත් සභාව වෙත භාර දීමට කටයුතු කර නොමැති අතර එම වාහන ජනාධිපති කාර්යාලය වෙත ගෙන ගොස් ඇති බැවින් පළාත් සභාව සතුව පැවති නවීන වාහන වලින් ඉතිරි වී ඇත්තේ පළාත් සභා නිලධාරීන්ගේ භාවිතය සඳහා ලබා දී තිබූ වාහන පමණක් වේ. පවතින ආර්ථික තත්ත්වය හමුවේ අලුතින් වාහන මිලදී ගැනීමට හැකියාවක්ද නොමැති බැවින් පැරණි වාහන අලුත් වැඩියා කර භාවිතයට ගැනීමට සිදුව ඇත. අවුරුදු කිහිපයක සිට වාහන මිලදී ගැනීමක් සිදුකර නොමැති අතරම පැරණි වාහන අලුත් වැඩියාකර භාවිතා කිරීමේ දී ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව වඩා ලාභදායී වන්නේ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ භාවිතය සඳහා වාහන ලබා ගැනීම වන නමුත් භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධානයන්ට අනුගතව එය සිදු කිරීම ඉතා දුෂ්කර කාර්යක් බැවින් විශේෂයෙන් දැනට කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහන එම කාලය අවසන් වීමෙන් අනතුරුව තව දුරටත් පවතින කොන්දේසි යටතේ බදු කාලය දීර්ඝ කිරීමට වාහන හිමිකරුවන් අකමැත්ත ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.<br><br>මේ වන විට ආණ්ඩුකාර කාර්යාලය සඳහා කල්බදු ක්‍රමය යටතේ වාහනයක් ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශ යේ අනුමැතියට යොමුකර ඇති බවත් ඉංජිනේරු අංශයට අවුරුද්දකට පෙර ලබාගත් වාහනයේ කල්බදු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු සිදුවී නොමැති බව හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ නිල වාහනය සඳහා සුදුසු වාහනයක් නොමැති වීම පිළිබඳවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් සවිස්තරාත්මක කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>පැරණි වාහන අලුත් වැඩියා කිරිමට වඩා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම වඩා ලාභදායී වන බැවින් නැවත වරක් මුදල් අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරිමට තීරණය කරන ලදී. | ආණ්ඩුකාර ලේකම් / සභා ලේකම්<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 03 | වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම | මේවන විට වාර්ෂිකව කාර්ය සාධන වාර්තාව සකස් කිරීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශය මඟින් සිදු කරනු ලබයි .නමුත් පාලන අංශයෙන් සිදුකල යුත්තේ අදාළ තොරතුරු එක් රැස් කර දීම පමණක් වන අතර එය අර්ථාන්විතව සකස් කල හැක්කේ සැලසුම් අංශයට බවට කරුණු ඉදිරිපත් විය .එබැවින් ඉදිරියේදී කාර්ය සාධන වාර්තාව සකස් කිරිම සැලසුම් අංශයට පැවරීම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් යෝජනා කරන ලදී.<br><br>ඒ අනුව සැලසුම් අංශය වෙත නිවැරදි ක්‍රමවේදයන්ට අනුව එය සකස් කිරීමට හැකියාව පවතින බැවින් 2023 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරිම සැලසුම් අංශය සිදු කිරීම සුදුසු බව තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 04 | කාර්ය සාධන තරඟාවලිය හා වෙබ් අඩවි තරඟාවලිය | 2023 කාර්ය සාධන තරඟාවලියේ අඩු කාර්ය සාධනයක් පෙන්නුම්කළ ආයතන මෙන්ම කාර්ය සාධන තරඟාවලිය සඳහා ඉදිරිපත් නොවූ ආයතන ඇති බවත් කාර්ය සාධන තරඟාවලියේදී ආයතන ඇගයීමට ලක්කළ විනිශ්චය මණ්ඩල විසින් ඔවුන් හඳුනාගත් අඩුපාඩු වලට අනුව ලබා දුන් අදහස් සම්පිණ්ඩනය කර දක්නට ලැබෙන පොදු අඩුපාඩු සම්බන්ධව සියළු ආයතන දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>2023 වර්ෂයේදී ප්‍රථම වරට පවත්වන ලද කාර්ය සාධන තරඟාවලියෙන් ලද අත්දැකීම් පදනම් කර ගනිමින් 2024 වර්ෂය සඳහාද කාර්ය සාධන තරඟාවලියක් පැවැත්වීමට සුදුසුබවට තීරණය විය.<br>2023 වර්ෂයේදී වෙබ් අඩවි පවතින ආයතන 109 කින් තරඟය සඳහා ඉදිරිපත් කළ හැකි වූයේ ආයතන 57 ක් පමණක් බවත් එයින් ආයතන 15 ක් ජයග්‍රහයකයින් බවට පත්වූ බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් පෙන්වා දෙන ලදී.<br>ආයතනගත වෙබ් අඩවි පරිශීලනය පහසුවන පරිදි සකස් වීම වැදගත් වන බවත් (User Friendly) සාකච්ඡා වූ අතර, ඒ අනුව වසරේ මුල සිටම මනා සූදානමකින් සියලූ ආයතනයන්ගේ සහභාගීත්වයෙන් කාර්ය සාධන තරඟාවලිය හා වෙබ් අඩවි තරඟාවලිය 2024 වර්ෂයට අදාළව පැවැත්වීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | වෙබ් අඩවි යාවත්කාලීන කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ ආයතනවලට අයත් තොරතුරු තාක්ෂණ සම්බන්ධ කටයුතු සිදු කරනු ලබන්නේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟිනි. ඒ අනුව වෙබ් අඩවි සම්බන්ධ කටයුතුද මෙම අධිකාරිය මඟින් සිදු කරනු ලබයි.මෙම සියලූම කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් මේ වන විට එම ආයතනය සතුව නොමැති බව සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේදී තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය කෙරෙහි වගකීම සෘජුවම නොතබා තම තමන්ගේ ආයතන විසින් තම ආයතනයේ නිලධාරියෙකු ලවා හෝ සුදුසු තොරතුරු තාක්ෂණ ආයතනයක් සම්බන්ධ කර ගනිමින් වෙබ් අඩවි කටයුතු යාවත්කාලීන කර පවත්වාගෙන යාමට තීරණය විය. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06 | පාසැල්වල සනීපාරක්ෂක කටයුතු සඳහා සහසුකම් සැලසීම | පාසැල්වල සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් වැසිකිලි ඉදිකිරීමට ඉල්ලීම් ඉදිරිපත් වන බවත් ඒ සඳහා ගන්නා ක්‍රියා මාර්ග සම්බන්ධවත් ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>ඒ අනුව එම සියලූ පහසුකම් සඳහා පාසැල්වල ඉල්ලීම් අනුව අවශ්‍ය ප්‍රතිපාදන සියල්ල ලබා දීමට කටයුතු කර ඇති බවට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 07 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කර ඇති නමුත් මේ වන විටත් ඒ සඳහා ප්‍රමාණවත් පිරිසක් සම්බන්ධ වී නොමැති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මෙම රක්ෂණාවරණය සඳහා ගෙවන දායක මුදල් සම්බන්ධව හා ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.ඒ අනුව යම් රෝගාබාධයක් වෙනුවෙන් වෙනත් රක්ෂණාවරණයක් යටතේ ප්‍රතිලාභ ලබා ගත්තද සමූහ ජීවිත රක්ෂණාවරණය යටතේ ඒ කිසිවක් නොසලකා ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කරන බවත් , සැත්කමකදී වෛද්‍ය වරයාගේ ලිපියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් සැත්කම සිදු කිරීමට පෙර ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවක් පවතින බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද මෙම රක්ෂණාවරණය ආරම්භ කරන ලද්දේ පාසැල්වල ගුරුවරුන් මූලික කරගෙන වන අතර එයින් ගුරුවරුන් වෙත විශාල ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාවක් ලැබී තිබූ නමුත් මේ වන විට මෙම රක්ෂණාවරණය ගුරුවරුන් වෙතින් ගිලිහී ගොස් ඇති බවත් මේ සම්බන්ධ පාසැල් දැනුවත් කිරිමේ වැදගත්කම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) පෙන්වා දෙන ලදී.<br><br>ඒ අනුව කලාප කාර්යාල හා පාසැල් අතර මේ පිළිබඳ දැනුවත් කිරිමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ හා බාහිර ආයතන වල සියලුම ආයතන ප්‍රධානීන් මෙහි වැදගත්කම පිළිබඳ දැනුවත් කර ප්‍රමාණවත් පිරිසක් මේ හා සම්බන්ධ කරගෙන මෙහි ප්‍රතිලාභ ඉදිරියේදීද නොකඩවා ලබා ගැනිමට සියළුම දෙනා උනන්දු කරවීමට තීරණය විය. | ආණ්ඩුකාර ලේකම්/ සභා ලේකම් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව /<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 08 | අනුර බණ්ඩාරණායක රංග ශාලාවේ අයිතිය පැවරීම හා එහි ඉදිකිරීම් සම්බන්ධව | මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති භූමිය දුම්රිය දෙපාර්තමේන්තුව සතුවන අතර ගොඩනැගිල්ල ඉදි කිරිම සඳහා අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් ද රජය විසින් ද ප්‍රතිපාදන යොදවා ඇත. එවකට සිටි ප්‍රධාන අමාත්‍යවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශ වෙත බුක්තිය පවරා බස්නාහිර පළාත් සභාව වෙත එහි සම්බන්ධතාවක් ඇති කරන ලද බව ප්‍රධාන නීති නිලධාරී විසින් පෙන්වා දෙන ලදී.<br><br>නමුත් මේ වන විටත් එය පවත්වාගෙන යාම හා අළුත් වැඩියා කටයුතු අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදු කරන අතර එහි රංග ශාලාවක් පවත්වාගෙන යාමේ හැකියාව ප්‍රාදේශීය සභාව සතු බවට කරුණු ඉදිරිපත් විය. ඒ අනුව මේ පිළිබඳ තීරණයකට එළඹීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය / අධ්‍යාපන අමාත්‍යාංශය |
| 09 | මීගමුව විවිධ සේවා සමූපකාර සමිතියේ ඉදිකිරීමක ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව | මීගමුව විවිධ සේවා සමූපකාර සමිතියේ ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුත්තක් සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මිල ගණන් කැඳවා 5 වෙනි ස්ථානයට ටෙන්ඩර් ඉදිරිපත්ව තිබූ අයට මෙය ලබා දීම සම්බන්ධව ඉදිරිපත් වී ඇති ගැටළුවක් සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br><br>ඒ අනුව මෙසේ සිදු කිරීම පිළිබඳ තොරතුරු විමසා ඉදිරි දිනයේදී ප්‍රධාන ලේකම් වෙත දන්වන බවට ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන හා සමූපකාර, අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 10 | බස්නාහිර පළාත් සභාව සතු නිල නිවාස හා ඉඩම් තොරතුරු යාවත්කාලීන කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් රජයේ නිවාස / නිල නිවාස පිළිබඳ දත්ත පද්ධතියක් නොවූ බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ හා හිටපු ප්‍රධාන ලේකම්ගේ මගපෙන්වීමට අනුව බස්නාහිර පළාත් සභාව සතු දත්ත පද්ධතියත් සකස් කිරීම සඳහා තොරතුරු රැස් කරමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>තවද පළාත් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඒවා ගැසට් කිරීමට ගරු ආණ්ඩුකාරතුමා කටයුතු කළ නමුත් නිවැරදි අයිතිය පෙන්නුම් කල හැක්කේ ඉඩම් හා ගොඩනැගිලි 59 ක පමණක් බවට ආණ්ඩුකාර ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>නිල නිවාස, රජයේ නිල නිවාස හා පළාත් පාලන නිල නිවාස වශයෙන් ආකාර දෙකකි. පළාත් පාලන නිල නිවාස පළාත් පාලන පනතින් පාලනය වන බැවින් එහි ගැටළුවක් නොමැති අතර , රජයේ නිල නිවාස පනත යටතේ පාලනය වන බස්නාහිර පළාත් සභාවට අයත් නිල නිවාස සම්බන්ධයෙන් නිසි බලධාරීත්වය දැනටමත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ලේකම් හා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පවරා දී ඇති බවට ප්‍රධාන නීති නිලධාරී විසින් වැඩි දුරටත් කරුණු දක්වන ලදී.<br><br>නමුත් දැනට ඉඩම් හා ගොඩනැගිලි 59 ක පමණක් අයිතිය තහවුරු කළ හැකි බැවින් එම ඉඩම් ගොඩනැගිලි 59 සඳහා පමණක් දේපළ ගැසට් කලහොත් අනිකුත් දේපළ සම්බන්ධව ගැටළුවක් මතුවන බවත් වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව මේ පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් ප්‍රධාන නීති නිලධාරී සමඟ වැඩි දුරටත් සාකච්ඡා කර තිරණයක් ගැනීමට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>ප්‍රධාන නීති නිලධාරී |
| 11 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ පවත්වන මාසික රැස්වීම | ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ පැවති මාසික රැස්වීමට සමගාමීව 2024.02.14 වන දින මීළඟ රැස්වීම පැවැත්වීමට කටයුතු සූදානම්ව පවතින බව ආණ්ඩුකාර ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව එම සාකච්ඡාවේදී සාකච්ඡා වූ කරුණු සම්බන්ධ ප්‍රගතිය අමාත්‍යාංශ ලේකම්වරුන් ගෙන් ඉල්ලා ඇති බවත් එය ලැබුණු පසු ගරු ආණ්ඩුකාරතුමා මීළඟ රැස්වීමට පෙර ප්‍රගතිය සම්බන්ධව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් ආණ්ඩුකාර ලේකම් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br><br>තම තමන්ගේ අමාත්‍යාංශ වලට අයත් ප්‍රගතිය ගරු ආණ්ඩුකාරතුමා වෙත කඩිනමින් ලබා දීමටත් ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරිමට අවශ්‍ය කරුණු සම්බන්ධව මනා සූදානමකින් සාකච්ඡාවට සහභාගී විය යුතු බවත් තීරණය විය. | ආණ්ඩුකාර ලේකම් ,<br>සභා ලේකම්<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 12 | ශ්‍රීමත් බාරොන් ජයතිලක විද්‍යාලයේ ගොඩනැගිල්ලේ ගැටළුව | මරදාන මාලිගාවත්තේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය පිහිටි ශ්‍රීමත් බාරොන් ජයතිලක විද්‍යාලයේ ගොඩනැගිල්ල පාසැල විසින් ඉල්ලා සිටීම පිළිබඳ පවතින ගැටළුව සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>ගරා වැටී තිබූ එම පාසැලේ අනිකුත් ගොඩනැගිලි හා එම ගොඩනැගිල්ල පිළිසකර කර එම ගොඩනැගිල්ලේ මීට වසර 9 කට පමණ ඉහතදී ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ කාර්යාලය පිහිටවන ලද බවට කරුණු ඉදිරිපත් විය.<br>එම කාර්යාලය මෙන්ම මුද්‍රණාලයක් සාර්ථක ලෙස මේ වන විට එහි පවත්වාගෙන යනු ලබයි. එම පාසැලේ සැලකිය යුතු ශිෂ්‍ය පිරිසක් අධ්‍යාපනය නොලබන අතර පාසැල සඳහා තවත් ගොඩනැගිල්ලක කිසිදු අවශ්‍යතාවක් දක්නට නොලැබෙන බවටත් එය පාසැල සඳහා ලබා දීම සාර්ථක නොවන බවටත් කරුණු සාකච්ඡා කරන ලදී.<br>එම ගොඩනැගිල්ල වඩාත් සුදුසු වන්නේ මේ වන විට එහි පවත්වාගෙන යනු ලබන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට බැවින් එම ආයතනය එහි පවත්වාගෙන යාමටත් පාසැලේ කටයුතු සඳහා එය ලබා නොදීමටත් තීරණය කරන ලද | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ |
| 13 | නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන කටයුතු සම්බන්ධව | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන ආයතනවලට අයත් ඉඩම් පවරා ගැනීම පිළිබඳ තොරතුරු රැස් කිරිම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙතින් කරුණු විමසන ලදී.<br>තවද නිවාස සැලසුම් අනුමත කිරිමේදී පළාත් පාලන ආයතනවලට අයත් ඉඩම් මෙගා පොලිස් සැලසුම් යටතේ සංවර්ධිත ඉඩම් ලෙස වෙන්කර ඇති බැවින් අනුමැතිය ලබා ගැනිමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදු වීමේ ගැටළුවක් මතුවී ඇති බවට ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රදේශ සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතන දැනුවත් කිරීමට පියවර ගත් නමුත් එම තොරතුරු මෙතෙක් ලැබී නොමැති බවට පළාත් පාලන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>මෙගා පොලිස් සංවර්ධන සැලසුමට අනුව බස්නාහිර පළාතම සංවර්ධිත කලාපයක් ලෙස නම් කර ඇති අතර ඉදිරියේදී අධිවේගී මාර්ගයක් ඉදිකිරිමට බලාපොරොත්තුවන කැලෑබඳ ප්‍රදේශයක් වුවද සංවර්ධිත ලෙස වෙන් කරනු ලබන බවට සාකච්ඡා කරන ලදී.පළාත් පාලන ආයතන වලට පමණක් මෙම සංවර්ධිත ප්‍රදේශ හඳුනා ගැනීමට නොහැකි අතර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් තම නගර සැලසුම් ඉදිරිපත් කල යුතු බවත් , එම නගර සැලසුම්වලට අනුව එම ප්‍රදේශ සංවර්ධිත ප්‍රදේශ ලෙස තීරණය කර ඉතිරි ඉඩම් පළාත් පාලන ආයතනවලට අයත් කොටස ලෙස තීරණය කිරීමට සාකච්ඡා වූ බවට පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>එබැවින් මෙම තොරතුරු පළාත් පාලන ආයතන වලින් රැස්කල හැකි වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නගර සැලසුම් ලබා දීමෙන් පසුව බවත් වැඩි දුරටත් කරුණු දක්වන ලදී. | ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශ |

| | | | |
|---|---|---|---|
| 14 | පළාත් පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම | බස්නාහිර පළාත් සභාවට අයත් පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා මේ වන විට ගුරුවරුන් බඳවා ගැනීමට තරඟ විභාග හා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කොට ඇති අතර පත්වීම් ලබා දීමේදී ගැටළු රැසකට මුහුණ දීමට සිදුවී ඇති බවට පළාත් රාජ්‍ය කොමිෂන් සභා ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>පවතින ඇතැම් පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පිරිසක් එම විෂය සඳහා සමත් වී නොමැති අතර ඇතැම් විෂයන් සඳහා පවතින පුරප්පාඩුවලට වඩා පිරිසක් එම විෂය සඳහා සමත් වී ඇති බවට කරුණු දක්වන ලදී.<br>එමෙන්ම ඇතැම් විශයන් සඳහා අධ්‍යාපන කලාප කාර්යාල වලින් ඉදිරිපත් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව එම කලාපයට අයත් පාසැල් ප්‍රමාණයත් අතර ගැලපීමේදී ඉතා අවම ප්‍රමානයක් බව දක්නට ලැබෙන බවටත් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ඒ සඳහා සිටින ගුරුවරුන් සංඛ්‍යාව පිළිබඳ නැවත වරක් අධ්‍යනයක් සිදු කරන ලෙසත් එම තොරතුරු කඩිනමින් ඉදිරිපත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.<br>තවද මෙම පුරප්පාඩු පිරවිම සඳහා විසඳුමක් ලෙස අධ්‍යාපන වේදීන් බඳවා ගැනීම සම්බන්ධව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව එම යෝජනාව සුදුසු බවට දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පාසැල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන වේදීන් බඳවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ |

වාර්තා කලේ : නදීෂා ඩී.සපරමාදු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ,

ප්‍රධාන ලේකම්,

බස්නාහිර පළාත.

දිනය: 2024.01. 24

එස්.එල්. ධම්මිකා කේ.විජයසිංහ
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.